**නිහාල් ශ්‍රී අමරසේකර**
*සාමාජික*
වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකාවේ)
වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (එක්සත් රාජධානියේ)
සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (ඕස්ට්‍රේලියාවේ)
සහතිකලත් වංචා පරීක්ෂකවරුන්ගේ සංගමය (එක්සත් ජනපදයේ)
රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ජාත්‍යන්තර සන්ධානය
දූෂණ විරෝධී ජාත්‍යන්තර අධිකාරීන්ගේ සංගමය

*සිංහල පරිවර්තනයකි*

<u>කුරියර් මගින්</u>

2012 ජුනි 22

මුදල් අමාත්‍ය
මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා,
අරලියගහ මන්දිරය,
කොළඹ 03.

උතුමාණනි,

**<u>හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පි.එල්.සී (HDL)</u>**

මම අවධානය යොමුකර සිටින්නේ, පාර්ලිමේන්තුවේදී 2011.12.21 දින අය වැය විවාදයේදී හිල්ටන් හෝටලය අයිතිකාර **HDL** සමාගමට අනෙයෝන්‍යයව කරන ලද කථාවේදී, මෙහි පහත වඩාත් පූර්ණ ලෙසින් විග්‍රහයකට භාජනය කර ඇති, අවධාරණයෙන් යුතුව කළ යම් ප්‍රකාශයන් කෙරෙහිය.

1. **<u>HDL සමාගම විසින් මහාභාන්ඩාගාරයට රු. මිලියන 12,099 ක් ගෙවීමට ඇත.</u>**

(අ). මහාභාණ්ඩාගාරය විසින් HDL සමාගමට අත්තිකාරම් කල ණය මුදල්වල ප්‍රාග්ධනය එකතු වී තිබුනේ රු.4,435,986,893/- ක ප්‍රමාණයක් පමණි.

| <u>ණය මුදලේ දිනය</u> | <u>මුදල (රු.)</u> | <u>පොළී අනුපාතය</u> |
|---|---|---|
| 97.07.01 | 288,567,631 | 12.50% |
| 99.07.07 | 469,742,070 | 12.50% |
| 00.07.03 | 464,427,826 | 12.50% |
| 01.07.03 | 360,618,876 | 18.56% |
| 02.07.03 | 446,803,874 | 12.50% |
| 03.07.01 | 340,024,378 | 9.40% |
| 04.07.01 | 395,658,959 | 8.59% |
| 05.06.30 | 255,639,338 | 10.28% |
| 06.06.30 | 157,555,617 | 11.61% |
| 07.06.30 | 344,772,738 | 18.77% |
| 08.06.30 | 456,077,609 | 20.59% |
| | 486,097,977 | 8.39% |
| එකතුව | 4,435,956,893 | |

(ආ). රු.12,098,634,769/77 මුදල් ප්‍රමාණයක් ඉල්ලුම්කර සිටිමින් මෙම ණය මුදල් පොළී සහිතව ආපසු ගෙවන ලෙසට 2011.05.03 දිනැති ලිපිය මගින් මහා භාණ්ඩාගාරය විසින් HDL සමාගමට අවශ්‍ය කර සිටියේය.

(ඇ). පොළී මුදල් ප්‍රාග්ධනය ඉක්මවා නොයායුතු ලෙසට සිවිල් නීති ආඥා පනතේ 5 වගන්තිය විධානාත්මක කර ඇත.

(ඈ). 2007 අංක. 07 දරණ සමාගම් පනතේ 277 වගන්තිය සමග කියවෙන 364 වගන්තියේ නියමයන් අනුව, මවිසින් 2006.11.17 දින HDL සමාගම ගණන් බේරා වසා දැමීමට පෙත්සමක් ඉදිරිපත් කර සිටීමෙන් අනතුරුව, HDL සමාගමෙන් අයකරගතයුතු පොළියක් නොමැත. *මෙහි මතු (ඊ) ඡේදයේ සඳහන් දැන්වීම යටතේ සහ එහි බලය මත* දැනුම්දීමක් පවත්නා මෙම නෛතික නඩුකරය පිළිබඳව පාර්ලිමේන්තුවේ කථානායකවරයාට ·දී සිටින ලදී.



167/4 විපුලසේන මාවත, තැ.පෙ. 1796, කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන: 2696814, 2686364, 4715988 ෆැක්ස්: 2697134 (මහනුවර දුරකථන / ෆැක්ස්: 4470442)
ඊ-මේල් : consultants21@gmail.com

(ඉ). <u>වසර දෙකක කාල සීමාවක් ඇතුළත</u> ඉහත කී මුදල් ඉල්ලීම් ආපසු ගෙවා සිටින ලෙසට, HDL සමාගම ආමන්ත්‍රනය කරන ලද 2011.5.10 දිනැති ලිපිය මගින් මහා භාන්ඩාගාරය විසින් ඉල්ලා සිටින ලදී.

(ඊ). එම හේතු තත්වයෙහිලා 2007 අංක. 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්හි නියමයන් අනුව නීත්‍යානුකූලව මට කළහැකි පරිද්දෙන්, HDL සමාගම ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට මා විසින් වාණිජ මහාධිකරණයට ඉල්ලීමක් කර සිටින ලද අතර, මහා භාණ්ඩාගාරය විසින් එයට එරෙහි වන ලදුව, *2006.11.17 දින සිට පැවතෙමින් තිබුණ ඉහත කී ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීම* ගැනද සඳහනක් ඊට ඇතුලත් වුන, ඒ පිළිබඳව කල්වේලා සහිත දැනුම් දීමක් පාර්ලිමේන්තුවේ කථානායකවරයාට දී සිටින ලදී.

(උ). 2011.05.10 දිනෙන් ආරම්භ වුනු ඉහත කී වසර දෙකක කාල සීමාව පවතිද්දී, එය කඩ කරමින්, ඉන් ටික කලකට අනතුරුව, HDL සමාගම හා සම්බන්ධ සමස්ථ සත්‍ය කරුණු යටපත් කරමින්, හුවා දැක්වූ දිග්ගැස්සී ඇති නඩුවල හේතු තත්ත්වයන් මත, 2011 අංක.43 දරණ පනතේ උපලේඛණයට එකම ඌණ ක්‍රියාකාරී ව්‍යවසාය ලෙසට HDL සමාගම රහසිගතව ඇතුළත් කර තිබුණි.

(ඌ). මාගේ විරෝධතා එකකදු වුවත්, <u>එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ක පුමාණයක් HDL සමාගමට එහිම අරමුදල් එවකට තිබියදී,</u> මා විසින් ලබා ගන්නා ලද අතුරු ඉන්ජන්ෂන් තහනම්වලට ආනුෂංගිකව HDL සමාගමේ එක්රැස්ව තිබුණ අරමුදල්වලින් සීමාසහිත මිටසුයි සහ සමාගමට හා තායිසෙයි කෝපරේෂන් වෙත ගෙවීමට, 1996 ඔක්තෝබරයේදී මහා භාණ්ඩාරගාරය උක්සුක වී බලකර සිටින ලදී.

(එ). ඒ අනුව 1996 ඔක්තෝබර් මසදි ජපන් යෙන් 2,138,082,192 ක එක්වර ගෙවීමක්ද, 1996 නොවැම්බර් මසදී පළමු වාරිකය වන ජපන් යෙන් 971,969.460 ක්ද, එනම් ජපන් යෙන් 3,110,081.652 ක්, එවකට එක්සත් ජනපද ඩොලර් මිලියන 27.5 ක මුළු මුදල් ප්‍රමාණයක් ගෙවන ලදී. 1997 සිට 2010 වර්ෂ පුරා සිමාසහිත මිට්සුයි සහ සමාගමට හා තායිසෙයි කෝපරේෂන් වෙත ඉතිරි වාරික 14 ගෙවා ඇත. තවත් එක වාරිකකයන් අත්හරිනු ලබන බව සිමාසහිත මට්සුයි සමාගමේ හා තායිසෙයි කෝපරේෂන් නීතිඥවරු විසින් 2006.05.15 දින ශ්‍රේෂ්ඨාධිකරණයට ස්ථිර කර ඇතත්, එයද මහා භාණ්ඩාගාරය විසින් ගෙවා ඇත.

(ඒ). HDL සමාගම උග්‍ර මූල්‍ය ප්‍රපාතයට ඇඳහෙළා දැමුනේ,රජයට හා මහජනයාට සිදු කල මහා පරිමාන පාඩුව සඳහා, නීතිය අභියස චෝදනාවට ප්‍රාත්‍ර කලයුතුව සිටි, එවකට අධිකරණ අමාත්‍ය සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයාවුන, බාහිර කටයුතු පිලිබඳ අමාත්‍යවරයාගේ, විපරීතකාරී කල්ක්‍රියාව සහ ක්‍රියාදාමයන්වල ප්‍රතිඵලයක් වශයෙනි.

(ඔ). උදක්ම මාගේ උත්සාහයන්වල ප්‍රතිඵලයක් වශයෙන් සිමාසහිත මිට්සුයි සහ සමාගම හා තායිසෙයි කෝපරේෂන්, රාජ්‍ය ඇපකරයෙන් යටතේ ඔවුන්ගේ ප්‍රකාශිත ඉල්ලීම්වලින් එවකට එක්සත් ජනපද ඩොලර් මිලියන 207 කට සමානවුන ජපන් යෙන් මිලියන 17,586 ක්, එනම් එවකට රුපියල් මිලියන 10,200 ක් <u>1995.6.30 දින</u> කපා හැර, එකගවුන ඉතිරිය (මුලිකව 1999 වන විට ගෙවීමට තිබුනද) එක වසරක අනුග්‍රහයක් සහිතව වැඩිදුර පුරා වසර 15 ක කාලසිමාවක් පුරා (මුලිකව 6% බැගින් වුනු පොලිය ) 5.25 % ක අඩුකල පොළියක් මත ගෙවීමට ප්‍රතිලේඛණගත කළ අතර, ඇපකරු වශයෙන් මෙය රජයට අතිශයින්ම ප්‍රතිලාභදායි විය. <u>මෙය වූයේ එවකට නිතිපති සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් මාගේ ක්‍රියාවන්ට එරෙහි වීම නොතකමිනි.</u>

(ඕ). HDL සමාගමට දෙන ලද ණය මුදල් මත ඉහත සඳහන් පරිදි රජය විසින් අය කළ පොලී හා සසඳා බැලිය හැකි, වසරකට 13% බැගින් වන සාමාන්‍ය පොලී ප්‍රමාණයකට <u>මවිසින් 1995.06.30 දින ලබා ගන්නා ලද එකී කපා හැරීම 2012.06.30 දින වන විට රුපියල් මිලියන 81,450 කට පුමාණගත වනු ඇත.</u>

(ක). එසේ හෙයින් <u>රුපියල් මිලියන 12,099</u> ක රජයේ ඉහත කී ඉල්ලීමට (සහ අක්කර 7 ක ඉඩමේ පර්චසය රුපියල් මිලියන 10 බැගින් වන රුපියල් මිලියන 11,200 ක මුලු අගයට) එරෙහිව HDL සමාගමට මාගේ දායකත්වය <u>අතිශයින්ම වඩාත් විශාල වන අතර, එය දැන් රුපියල් මිලියන 81,450/- ක්ව පවතී.</u>

2. <u>ඉඩම සඳහා රුපියල් මිලියන 136.8 ක බදු ගෙවීම මත ගෙවා ඇත්තේ රුපියල් මිලියන **27.3 ක් පමණි.**</u>

(අ). එවැනි හේතු තත්වයන් අනුව රජය සහ මා අතර එළඹි 1995.6.28 දින අංක 3 දරණ ගිවිසුමෙහි පහත දැක්වෙන කොන්දේසිය ඇතුලත් කරන ලදී.

"1. රජය විසින්

(අ). කොළඹ හිල්ටන් හෝටලය හා සම්බන්ධ එවලන් චතුරශ්‍ර ඉඩම් බද්ද අවලංගු කර සහ හෝ අවසන් කර නාගරික සංවර්ධන අධිකාරියට HDL සමාගමේ කොටස් විභාජනයකින් පියවනු ලබන ප්‍රතිශ්ඨාවකට, දැනට HDL සමාගමට අතුරු බද්දකට දී නොමැති ක්‍රීඩා සංකීර්ණය/ විනෝදාංශ පෙදෙස අඩංගු ඉතිරි බිම් කොටසද ඇතුලුව කෙලින්ම HDL සමාගමට බදු දීම සිදු කිරීමට පියවර ගැනීමෙහි ලා නාගරික සංවර්ධන අධිකාරියට සහය දැක්වීම

කළයුතු සහ කරනවා ඇත."

(ඇ). <u>ඒ අනුව එකී ඉඩම් රජයේ සන්කතයට පත් කරමින්</u> රාජ්‍ය ඉඩම් ආඥා පනතේ 3 වගන්තියේ නියමයන් ප්‍රකාර අංක 673 සහ 674 දරණ විශේෂ ප්‍රදාන පාවරණය කිරීමේ ප්‍රදාන පත්‍ර 1999.07.26 දින ලියා අත්සන් කිරීම, ජනරජයේ ජනාධිපති විසින් බලය පැවරූ පරිදි, එවකට නීතිපතිවරයා විසින් සිදුකරන ලදී.

3. <u>37% කට අධික අතිරික්තයකින් කළමණාකාර ගාස්තු අඩු කර ඇත. - එය සාමාන්‍යයෙන් 15% විය යුතුව තිබුණි.</u>

(අ). 2005.10.05 දිනැති කැබිනට් සංදේශය ප්‍රකාර, ඔබතුමාද ඇතුළත් වී ඇති කැබිනට් මණ්ඩලය විසින්, <u>2005.10.13</u> දින අනුමත කර ඇති, කැබිනට් මණ්ඩලය විසින් පත්කල ප්‍රමන්ත්‍රණ කමිටුවේ <u>2005. 07.11</u> දිනැති වාර්තාවේ මෙසේ දක්වා ඇත.

"17 නව කළමණාකාර ගිවිසුමේ නියමයන් හි ශීර්ෂයන් හිල්ටන් ඉන්ටර්නැෂනල් සමග සලකා බලනු ලැබ වත්මන් කළමණාකරණ ගිවිසුම හා සසඳා බැලීම පහත දැක්වෙන අයුරු වන්නේය.

| | වත්මන් | යෝජිත |
|---|---|---|
| කළමණාකරණ ගාස්තු | දළ මෙහෙයුම් ලාභයෙන් (GOP) 25% ක්, මෙය ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ වැද්දුම් (FF&E) අඩුකිරීමෙන් පසුවය. | පදනම් ගාස්තුව වශයෙන් ආදායමෙන් 2% ක් + දිරිගැන්වීමේ ගාස්තු වශයෙන් ගැලපු දළ මෙහෙයුම් ලාභයෙන් (AGOP) 7% ක්, එය රු. මිලියන 400 ඉක්මවුවහොත් පමණකි. ගැලපු දළ මෙහෙයුම් ලාභය (AGOP) = දළ මෙහෙයුම් ලාභය (GOP) ගණනයන් - රක්ෂණ |
| කන්ඩායම් සේවා සහ ප්‍රතිලාභ | ආසන්න වශයෙන් දළ මෙහෙයුම් ලාභයෙන් 7% | ආදායමෙන් 2% |
| කාලසීමාව | එකක් වසර බැගින් වන අනුක්‍රමික කාල සීමා තුන (3) කට දීර්ඝ කිරීමේ මනාපය සහිතව කාල සීමාව 2007.12.31 දින අහෝසි වේ. | දෙපාර්ශවයේම අන්‍යෝන්‍ය එකඟතාවය මත වැඩිදුර වසර පහක කාල සීමාවන් දෙකකට දීර්ඝ කිරීමේ මනාපය සහිතව මූලික කාලසීමාව වසර දහය (10) කි. |
| ගෘහ භාණ්ඩ වැද්දුම් සහ සවි කිරීම් සංචිතය | වසරකට එක්සත් ජනපද ඩොලර් 700,000/- | දළයෙන් 5% කට ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ වැද්දුම් (FF&E) සංචිතය ස්ථාවර කරනු ඇත. |
| කලින් නතර කිරීම් | ඉඩක් නොමැත | ඉඩකඩ තිබේ. මොනයම් හෝ අඛණ්ඩ වසර දෙකකදී හෝටලයේ සාමාන්‍ය කාමරයක ආදායම (Rexpar) එහි තරගකරුවන්ගේ ආදායම ඉක්මවා නොයන්නේ නම් වන්දිගෙවීමක් නොමැත. පොලියක් අයකර විකුණනු ලැබුවහොත් කොන්ත්‍රාත්තුව නතර කිරීම සිදුවුවහොත් වන්දි ගෙවිය යුතු වන්නේය. |

(ආ). HDL සමාගමේ සභාපතිධුරයෙන් <u>2005.11.10</u> දින මම ඉල්ලා අස්වුන අතර, පූර්වෝක්ත කාරණය පවතමින් තිබුණ අතර, ඉහත කී නියමයන් පිළිබඳ එකඟ වී ගිවිසුමක කෙටුම්පතක් පවා *සමාප්ථ* කර තිබියදීත්, <u>මහා භාන්ඩාගාරය විසින් එයින් ඔබ්බට ක්‍රියාන්විතවී නොමැත.</u>

(ඇ). 1997 ඔක්තෝබර් මස බෝම්බ පිපිරීමට ආනුශාංගිකව සමූහ ව්‍යාපාර අතුරුබාධක රක්ෂණ සහතිකය (Group Business Interruption Insurance policy) යටතේ කරන ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක ගෙවීමට හිල්ටන් ඉන්ටර්නැෂනල් විසින්, 1998 ජනවාරි මසදී වංචනික ලෙස හිමිකම් පාමින්, එක්සත් ජනපද ඩොලර් මිලියන 7 ක වටිනාකමින් යුතු HDL සමාගමේ කොටස් ඔවුන් වෙත විභාජනයක් අවධාරණයෙන්ම ඉල්ලා සිටින ලද අතර, එම හිමිකම් පෑම මම තරයේම බිඳ හෙලමින්, එය HDL සමාගමට අයත් වන බව සාර්ථක ලෙස ස්ථාපිත කර සිටියෙමි.

(ඈ). HDL සමාගමේ කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 452.3 ක් පමණක් වීමෙන්, මාගේ එම ස්ථාවරය නොවන්නට, එම වංචනික කූටෝපකාරී ක්‍රමය මගින් HDL සමාගමේ වැඩිකළ කොටස් ප්‍රාග්ධනයෙන් 48.5% ක්ම හිල්ටන් ඉන්ටර්නැෂනල් අත්පත් කරගන්නට තිබුණු අතර, ආනුශංගිකව ජපන්වරුන්ගෙන් 14.2% ක අඩුවුනු කොටස් හිමිකම සහිතව, ඔවුන් සාමූහිකව HDL සමාගමේ 62.7 % ක පාලන කොටස් හිමිකමක් අත්පත් කර ගනිමින් රජයේ කොටස් හිමිකම 33.4% ක සුළුතර තත්වයට අඩුවන්නට ඉඩ තිබුණි.

පාර්ලිමේන්තුව අභියස සමස්ථ සත්‍ය කරුණු තැබීම සඳහා, අනුමාන ලෙසින් මහාභාන්ඩාගාරය විසින්, ඔබ උතුමාණන්, මුදල් අමාත්‍යවරයා වශයෙන්, හරියාකාරව දැනුවත් නොකිරීම ගැන මම කණගාටුවෙමි. එමගින් පාර්ලිමේන්තුවට කරන ලද එවැනි අසම්පූර්ණවූ ප්‍රකාශය, <u>අසත්‍ය සහ නොමඟ යවන්නක් බවට පත්වේ.</u>

මෙයට අවංක,

නිහාල් ශ්‍රී අමරසේකර

පිටපත් - ලලිත් වීරතුංග මහතා, ජනාධිපති ලේකම් - *අතිගරු ජනාධිපතිතුමා හරියාකාරව දැනුවත් කිරීමට*